වලිකාමම් - බටහිර ප්‍රාදේශීය සභාව

යාපනය දිස්ත්‍රික්කය

--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 20 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 10 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

(අ) වත්කම් සහ ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන්හි කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | 03 | 42,870 |
| වැඩියෙන් දැක්වීම් | - | - | 03 | 690 |
| සාවද්‍ය වර්ගීකරණයන් | 01 | 30,125 | - | - |

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ප්‍රධාන ලෙජරය අනුව ගබඩා විෂයයන්ගේ වටිනාකම රු.313,077 ක් වූ අතර උපකාරක ලෙජරය අනුව ශේෂයන්ගේ මුළු එකතුව රු.202,355 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.6,137,263 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.16,476,671 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.9,613,610 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-----------------

අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර රු.9,671,921 ක වෙනසක් ද අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.8,649,285 ක වෙනසක් ද විගණනයේදි නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

---------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 1,699 | 1,847 | 5,331 |
| බදු කුලි | 8,618 | 9,281 | 12 |
| බලපත්‍ර ගාස්තු | 784 | 962 | 60 |
| වෙනත් ආදායම් | 34,822 | 43,505 | 18,038 |

2.3.2 වරිපනම් බදු සහ වෙනත් බදු

------------------------------

2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.5,331,436 ක් වුවද 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පණත ප්‍රකාරව ගෙවීම් පැහැර හැරි පුද්ගලයන්ගෙන් හිඟ බදු අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3.3 ව්‍යාපාර බදු අයකර ගැනිම

------------------------------

බිල් නිකුත් කිරිමේ පරිපාටියක් මගින් වෙළඳ බලපත්‍ර හිඟ මුදල් ගිණුම් ගතකර නොතිබුණි. එබැවින් වෙළඳ බලපත්‍ර ආදායම ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.

2.3.4 ආදායම් අභිමිවීම

--------------------

(අ) ගැසට් නිවේදනය ප්‍රකාරව, සභා බල ප්‍රදේශය තුල පවත්වන විනෝද්තමක වැඩසටහන් මත 5% ක විනෝද බද්දක් අයකරගත යුතුය. නමුත් විනෝදාත්මක වැඩසටහන් දෙකක් වෙනුවෙන් බදු අයකර නොතිබුණි. තවද තැන්පතු ලබා නොගෙන තැන්පතු වලින් රු.30,282 ක මුදලක් ආපසු ගෙවා තිබුණි.

(ආ) 1999 වර්ෂයේ සිට විදුලි බලය සැපයිමට අදාළ කාර්යයන් ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාරදී තිබුණ නමුත්, වීථි ලාම්පු නඩත්තුව සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම් වලට එළඹ නොතිබුණි. එම නිසා සභා බල ප්‍රදේශය තුල වීථි ලාම්පු නඩත්තුව වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් අයවිය යුතු රු.70,303 ක මුදලක් ප්‍රතිපූරණය කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ

------------

2012 මැයි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා උසාවි දඩ අයකරගෙන නොතිබුණි.

2.3.6 මුද්දර ගාස්තු

-----------------

2006 සිට 2012 දක්වා කාල පරිච්ඡේදය සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු සොයා දැනගෙන ඇස්තමේන්තු කර නොතිබුණි. කෙසේ වුවද ආදායම් සහ අයවිය යුතු මුදල් ලෙස රු.20,609,652 ක් දක්වා තිබුණි. නමුත් මෙම වාර්තාවේ දිනය දක්වා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

2.4.1 නිශ්ක්‍රීය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

----------------------------------------------------------

1999 සිට 2008 දක්වා කාල පරිච්ඡේදය තුල මිලදි ගත් සභාවට අයත් පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රීයව සහ අලාභහානි වී තිබුණි.

| වත්කමේ ස්වභාවය | මිළදි ගත් දිනය | වටිනාකම |
|---|---|---|
| ඡායා පිටපත් යන්ත්‍රය - කොනිකා 1212 | 1996.06.18 | 177,975 |
| සොනික් පරිගණකය | 2008.12.31 | 61,500 |
| ලේසර් මුද්‍රණ යන්ත්‍රය | 2008.12.31 | 14,700 |
| වතුර ටැංකි 05 ක් | - | - |
| කේතල් 02 ක් | - | - |

2.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධාන වලට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රිති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව. | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය සභා (මුලා සහ පරිපාලන) රීති - 1988 | | |
| (i) III පරිච්ඡේදයේ 29 වගන්තිය | - | රැස් කරන ලද සියළුම මුදල් දිනපතා බැංකු ගතකළ යුතුය. කෙසේ වුවද 2012.01.01 සිට 2012.12.06 දක්වා කාල පරිච්ඡේදය සඳහා දෛනික මුදල් එකතුව වු රු.16,970 ක් ඉහත සඳහන් පරිදි බැංකුගත කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) III පරිච්ඡේදයේ 66 වගන්තිය | - | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පණතේ 150(4) වගන්තිය ප්‍රකාරව සභාවට අයවිය යුතු රු.73,293 ක් වු හිඟ ආදායම් අයකර ගැනිමට ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත | - | සභාව විසින් අයකරගත් රු.16,777 ක් වු භාණ්ඩ හා සේවා බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. ඒ වෙනුවට එම මුදල ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | - | 2002-2003 දක්වා කාලපරිච්ඡේදය සඳහා වු රු.11,429 ක් වු එකතු කළ අගය මත බදු රැස්කිරිම් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණු අතර විවිධ තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | - | 1983 සිට 2010 දක්වා කාල පරිච්ඡේදයට අදාළ කල් ඉකුත් වූ තැන්පතු රු.841,195 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 132 වගන්තිය | - | අදාල පාර්ශවයන්ගෙන් අධිකාර බලය ලබා නොගෙන පළාත් පාලන සතිය වැඩසටහනට අදාළ වු කාර්යයන් වෙනුවෙන් සභාවේ අරමුදලින් රු.74,520 ක් වු සංග්‍රහ වියදම් ගෙවා තිබුණි. |

2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

(අ) තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පැදුරු සහ කොට්ට මිළදී ගැනිම සඳහා සභා අරමුදලෙන් රු.13,080 ක මුදලක් ගෙවා තිබුණි. මෙය අවිධිමත් ගෙවීමක් ලෙස සලකනු ලැබේ.

(ආ) යාපනය දිස්ත්‍රික්කයෙහි ලියාපදිංචි ආයුර්වේද නිෂ්පාදන සහ විකුණුම් මධ්‍යස්ථාන පවතින නමුත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ පෞද්ගලික ඖෂධ වෙළඳ සැලකින් රු.69,525 ක් වටිනා ආයුර්වේද ඖෂධ මිළදී ගෙන තිබුණි.

2.7 අත්හැර දමන ලද ව්‍යාපෘති

---------------------------------

2012 වර්ෂය සඳහා වූ සභාවේ අයවැය ලේඛනය අනුව පිරිවැය රු.1,500,000 ක් වූ ව්‍යාපෘති 02 ක් සභාවේ අරමුදලින් ක්‍රියාත්මක කළයුතු විය. කෙසේ වුවද සභාව ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු වෙනුවට පොලී ඉපයීමේ අරමුණෙන් චන්කනායි මහජන බැංකු ශාඛාවේ ස්ථාවර තැන්පතුවල රු.3,000,000 ක මුදලක් ආයෝජනය කර තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

1998 සිට 2012 දක්වා ප්‍රජා ශාලා සහ වැසිකිලි ඉදිකිරිම සඳහා වූ සභාව වෙත ලැබුණු රු.1,198,863 ක් වූ පරිත්‍යාග එම අදාළ විශේෂිත කාර්යයන් සඳහා උපයෝජනය නොකොට විවිධ තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

3. පද්ධති සහ පාලන

----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් රැස්කිරිම

(ආ) ගිණුම්කරණය

(ඇ) ප්‍රදාන

(ඈ) විවිධ තැන්පතු

(ඉ) අයවැය පාලනය